# අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014
## සිංහල - I පත්‍රය
## පිළිතුරු සඳහා මග පෙන්වීම

1. (අ) (i) (අසාධ්‍ය වූ) කුෂ්ඨ රෝගයකි.
(ii) එය කෙසේවත් සුවපත් කළ නොහැකි බව / අසාධ්‍ය වූවක් බව
(iii) පිළිකුල් සහගත බවට පත් වූ මෙබඳු රෝගයකින් පෙළෙමින් විඳින රජ සැප කුමකට ද? යන්නයි
(iv) ගවර වළෙක්හි - ගවයන්ගේ මල මූත්‍රා එක් රැස් වූ වළ
ගෝ කුණපයක් - ගවයකුගේ කුණු වී ගිය සිරුරක් **(ලකුණු 04යි)**

(ආ) (i) විදුලි කෙටීම, අකුණු ගැසීම (අහස ගිගුරුම් දීම) මහා වැසි ඇද වැටීම
**(ලකුණු සම්පූර්ණයෙන් ලැබීමට කරුණු 03ම ලියා තිබිය යුතුයි)**
(ii) විළි පැහැරීම - විදුලි ගැසීම
හඬ ගැසීම - අහස ගිගුරුම් දීම
ප්‍රසව දුක - මහ වැස්ස / අධික වර්ෂාව
නැතහොත්, විදුලි ගැසීම, අහස ගිගුරුම් දීම, මහා වැස්ස
(iii) නොතෙමී දරුවා බිහි කරන්නට / දරු ප්‍රසූතියට තැනක් ඉදි කර දෙන ලෙස
(iv) අවධි විභක්ති පදයකි **(ලකුණු 04යි)**

(ඉ) (i) නොයෙකුත් සුප්, ව්‍යංජනයෙන් යුක්ත බත් හා අවුළුපත් (කැවිලි) ආදියයි.
(ii) ආශ්චර්යවත් කුමාරිකාවකයැ යි කියමින් මැණික් රැසක් මත සිටුවා අභිෂේක මඟුල් කොට (ශුද්ධ වූ ජලයෙන් හිස් තෙමා) සාලිරාජ කුමාරයන්ට පාවා දීම.
(iii) ගව මළකුණක් තුළ තිබුණ ද ගොරෝද / ගෝරෝචන නම් වූ සුවඳ ද්‍රව්‍ය ඉවත නොදමා අර ගනිති. එහෙත් ගව මළකුණ එසේ නොගනිති.
(iv) මෙහෙ නිමවා - ආහාර අනුභව කොට
ආශ්චර්යවත් - පුදුම එළවන සුලු / පුදුම සහගත / විස්මයජනක **(ලකුණු 04යි)**

(ඊ) (i) රන්වන් ඒදණ්ඩකට / පාලමකට
(ii) ගඟෙහි ක්‍රීඩා කරමින් නාන කාන්තාවන්.
(iii) තරංග නිසා ලෙළ දෙන / ලීලෝපේත වන
(iv) රූපක **(ලකුණු 04යි)**

(උ) (i) සද්ධර්මරත්නාවලියේ, මච්ඡරියකෝසිය සිටාණන්ගේ කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද පාඨයකි. බුදුන් වහන්සේ කබලු වළඳන්නට අපේක්ෂාවෙන් සිටින බව දැන ගන්නා කෝසිය සිටුවරයා මුගලන් තෙරුන්ගෙන් මෙසේ අසයි.
(ii) පන්සිය පනස් ජාතක පොතෙහි එන ගණ්ඩතින්දු ජාතකයෙහි ඇතුළත් පාඨයකි. පංචාල රජු සමග ආපසු නුවරට එන පුරෝහිත බමුණාට දිය සිඳුණු පොකුණෙහි වූ මඬුවෙක් / මැඬියෙක් මෙසේ කියයි.
(iii) සද්ධර්මාලංකාරයෙහි ඇතුළත් ආරක්ඛක අභය ස්ථවිර වස්තුවෙහි එන පාඨයකි. (හරන්තික හොරාට දඬුවම් දී ආපසු පැමිණෙන) උපාසකයා ගම්මැද සිට ගැමියන් අමතා කළ ප්‍රකාශයකි.
(iv) මළගිය ඇත්තෝ නවකථාවේ ඇතුළත් පාඨයකි. කියොතෝ ගොස් ආපසු පැමිණෙන දෙවෙන්දොරා නොරිකෝගේ වෙනස් වීම පිළිබඳ ව විමසන විට ඇය පවසන දෙයට දෙන පිළිතුරකි.
(v) ප්‍රදීපාගාරය යට කෙටිකථාවෙන් උපුටා ගත් පාඨයකි. කථකයා සහ ඔහුගේ බිරිඳ සමන්තිකා කොළඹට රැගෙන යාමට කැමැත්ත පළ කරන විට ඇය මෙසේ ඔවුනට පිළිතුරු දෙයි.
(vi) රත්නාවලී නාට්‍යයේ ඇතුළත් පාඨයකි. උදයන රජු සාගරිකා යැයි රැවටී වාසවදත්තා බිසවට පෙම්බස් දොඩන අවස්ථාවේ දී වාසවදත්තාගේ පැනයට පිළිතුරු ලෙස කාංචනමාලා මෙසේ කියයි. **(ලකුණු 08යි)**

(ඉ)	කුඩා දැරියන් දෙදෙනෙකු භුක්ති විඳින භෞතික සම්පත්වල විෂමතා ඇසුරෙන් සමාජ විෂමතාව පැහැදිලි කිරීම කවියාගේ අරමුණයි.

මේ විෂමතාව නිරූපණය කිරීමේ දී අසරණ දැරියගේ තත්ත්වයත්, කුඩා දියණියගේ තත්ත්වයත් සන්සන්දනාත්මකව පෙන්වයි. ''කිලිටි වී ගිය ගවුම, තෙල් පොදක් නොමැති හිස, ඉරී ගිය පත්තර පිටුව, අසරණ දෙනෙත, සෝබර ගීය'', ආදිය මගින් අසරණ දැරියගේ ස්වරූපය ද ''අනෙක මසවුළු සමග බත් කටක්, දිවා භෝජනය'' ආදිය මගින් දියණියගේ ස්වරූපය ද දක්වා ඇත. භාවිකාර්ථවත්, සංක්ෂිප්ත බසක් හා සංකල්ප රූප යොදා ගනිමින්, තම සදය හැඟීම් ඉදිරිපත් කිරීම සඳහා කවියා නිදහස් ආකෘතියක් යොදා ගෙන ඇත. සමාජ විෂමතාව නිරූපණය සඳහා කවියා විවිධ රචනෝපක්‍රම භාවිත කර තිබේ.

**(ලකුණු 16යි)**

2.	උපහාසය මෙන්ම සානුකම්පිත දෘෂ්ටිය ද හෙළිවන අවස්ථා:

පටාචාරා වස්තුව:

- ★ දෙමාපියන් සිටු දියණිය ආරක්ෂා කළ ආකාරය
- ★ පටාචාරා සිටු මැඳුරෙන් පලා යන අවස්ථාව
- ★ දරු ප්‍රසූතිය සඳහා දෙමාපියන් වෙත යාම
- ★ පටාචාරාවගේ දෙවන දරු ප්‍රසූතිය සිදුවන අවස්ථාව
- ★ සැමියා අහිමි වන අවස්ථාව
- ★ ගඟෙන් එතෙර වීමට යාමේ දී දරුවන්ගේ වියෝගය නිසා ලබන අමිහිරි හා දුක්ඛදායක අත්දැකීම.
- ★ දෙමාපියන්ගේ වියෝගය නිසා උමතුභාවයට පත් වීම

මච්ඡරියකෝසිය කථා වස්තුව:

- ★ මච්ඡරියකෝසිය සිටුවරයා තම ආශාව සඟවා ගෙන ඇඳෙහි වැතිරී සිටින අවස්ථාව
- ★ බිරිඳ හා සංවාදය
- ★ කබලු පිසින්නට සූදානම් වන අවස්ථාව
- ★ මුගලන් තෙරුන් මුණ ගැසීම හා සංවාදය
- ★ පිසූ කබලු බුදු පාමොක් සංඝයාට පූජා කිරීම **(ලකුණු 15යි)**

**නැතහොත්**

මෙහි දී ගණ්ඩතින්දු, ඡද්දන්ත, සම්බුලා හා දේවධර්ම ආදී ජාතක කථා අතරින් දෙකක චරිත නිරූපණය කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.

ගණ්ඩතින්දු ජාතකය:

කිසියම් රටක පාලකයන්ගේ හා පාලිතයන්ගේ හැසිරීම් ද, එමගින් මහජනයාට අත්වන විවිධ අර්බුදකාරී තත්ත්වයන් ද, යහපත හා අයහපත ද ආශ්‍රිත තොරතුරු ගණ්ඩතින්දු ජාතකයෙන් ඉදිරිපත් කෙරේ.

ඡද්දන්ත ජාතකය:

පාලකයන්ගේ, පාලිතයන්ගේ චර්යාවන් එක් අතකින් නිරූපණය වන අතර, අනෙක් අතින් පාලකයන්ගේ අවශ්‍යතා සපුරා ගැනීමට ගන්නා භයානක උපක්‍රම නිසා වනගත අහිංසක සතුන් පවා වැනසෙන ආකාරය ද මින් කියවේ. එමෙන් ම පලිගැනීම, උපක්‍රමශීලී බව, ඊර්ෂ්‍යාව වැනි හැඟීම් මෙන් ම දයාව, අනුකම්පාව වැනි හැඟීම් ද මෙහි චරිත මගින් නිරූපණය කෙරේ.

සම්බුලා ජාතකය:

කාන්තාවන්ගේ උත්කෘෂ්ට ගුණාංග ද, කාමුක පුද්ගලයන්ගේ අවිනීත හැසිරීම් ද, ආදරයෙන් වෙළී ගිය කල්හි පුද්ගලයන් මුළා වී හැසිරෙන ආකාරය ද, දුකින් මිදී සැප විඳින කල්හි මුල් අවස්ථා අමතක වී අකෘතඥව හැසිරීම ද, කාන්තාවන් තුළ ඇති වන සපත්නී රෝෂය ද මෙම ජාතක කථාවෙන් නිරූපණය වේ.

දේවධර්ම ජාතකය:

පුද්ගලයාගේ අවංක භාවය, සහෝදර ප්‍රේමය, මෙන්ම තම දරුවන්ට ආදරය දක්වමින් අනෙක් දරුවන් අයහපතෙහි හෙළීමට ඉදිරිපත් වන ආකාරය, පුද්ගලයන් ලබා දෙන පොරොන්දු නිසා අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දෙන ආකාරය වැනි කරුණු මෙම ජාතක කථාවෙහි නිරූපණය කෙරේ. **(ලකුණු 15යි)**

3. චරිත නිරූපණය:

සාලිරාජ වස්තුවේ දී සාලිය, අසෝකමාලා හා දුටුගැමුණු රජතුමා ආදීන්ගේ චරිත ද ආරක්ඛකක අභය ස්ථවිර කථාවස්තුවේ දී ආරක්ඛකක අභය, හරන්තික හා උපාසක යන චරිත ද කෙරෙහි අවධානය යොමු විය යුතුය.

අවස්ථා නිරූපණය:

සාලිරාජ කථාවස්තුවේ දී සාලිය කුමරා තමන්ට ලැබෙන ආදායම් බදු පරිත්‍යාග කිරීම, ජනතාවගේ උද්ඝෝෂණ, සාලිය අසෝකමාලා හමුවීම, අසෝකමාලා හා දුටුගැමුණු රජු හමු වීම සහ ආරක්ඛකක අභය ස්ථවිර කථාවස්තුවේ දී උපාසකයා සිවුරු සඳහා පූජා කළ වස්ත්‍ර නැති වීම, සොරකම් කළ පුද්ගලයා අල්ලා ගැනීම, ඔහුට දඬුවම් දීම, අභය ස්ථවිර සොරාට උපස්ථාන කිරීම ආදි අවස්ථා ගැන අවධානය යොමු කළ යුතුය.

මෙම චරිත හා අවස්ථා ඇසුරින් සාහිත්‍ය රසය මතුවන ආකාරය පැහැදිලි කළ යුතු ය. **(ලකුණු 15යි)**

4. සැඳෑ, නිශා, උදා, මඟ, වන, තොටගමු වෙහෙර ආශ්‍රිත වනය ආදී වැනුම් අතරින් දෙකක් තෝරා ගෙන කවියා ස්වභාව සෞන්දර්ය වර්ණනයට ලක් කරන ආකාරය පැහැදිලි කළ යුතු ය. **(ලකුණු 15යි)**

5. නවකථාවේ ප්‍රධාන චරිතවලට ආවේණික ගති ස්වභාවයන් හා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය මනා හේතුඵල සම්බන්ධතාවකින් යුක්ත අවස්ථා, සිද්ධි ඇසුරෙන් විකාශනය කර ඇති අයුරු විමසිල්ලට ලක් කළ යුතුය. එහිදී,

දෙවෙන්දොරා ජපානයට පැමිණීම.
නොරිකෝ හමු වීම
දෙවෙන්දොරා කියොතෝ යාම හා ආපසු පැමිණීම
නොරිකෝගේ නිවසේ නැවතීම
ජීවිතයෙන් පලා යන්නට දරන තැත
විවාහය පිළිබඳ අවිනිශ්චිත කතා බහ
ලංකාවට පැමිණීම

වැනි අවස්ථා පිළිබඳ ව අවධානය යොමු කළ හැකිය. **(ලකුණු 15යි)**

6. කොළඹ ගමන, තාත්තාගේ මළගම යන කෙටිකථා නිදසුන් ලෙස ගැනීම අපේක්ෂිතයි. ඒ හැර සත්ගුණවත් සාමෙල් හා තමන්ගේ දරුවෝ, මාවතේ දරුවෝ, මුදියන්සේ මාමා වැනි කෙටිකථා කෙරෙහි ද අවධානය යොමු කළ හැකියි. මෙහි දී සමාජ පංති දෙකක ආකල්ප හා ඇගයීම්වල වෙනස විමසීමට ලක් කළ යුතු ය. **(ලකුණු 15යි)**

7. කොළඹ යුගයේ මුල් පරපුර, දෙවන පරපුර, හෙළ හවුල සහ නිසඳැස් කවීන් නියෝජනය කරන පද්‍ය නිර්මාණ ඇසුරෙන් උචිත ලෙස කරුණු ඉදිරිපත් කිරීම අපේක්ෂිතයි. **(ලකුණු 15යි)**

8. මදන මහෝත්සවය, උදයන රජු හා සාගරිකා හමුවන අවස්ථා, අන්තඃපුරය ගිනි ගැනීම හා සාගරිකා රජුට භාර දීම වැනි අවස්ථාවලදී උදයන රජුගේ චර්යාවන් විශ්ලේෂණය කරමින් කරුණු දැක්වීම අපේක්ෂිතයි. **(ලකුණු 15යි)**

# අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2014

## සිංහල - II පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1.1 | 3 |
| 1.2 | 1 |
| 1.3 | 4 |
| 1.4 | 5 |
| 1.5 | 2 |
| 1.6 | 1 |
| 1.7 | 4 |
| 1.8 | 3 |
| 1.9 | 2 |
| 1.10 | 5 |
| 1.11 | 1 |
| 1.12 | 3 |
| 1.13 | 5 |
| 1.14 | 1 |
| 1.15 | 2 |
| 1.16 | 5 |
| 1.17 | 3 |
| 1.18 | 4 |
| 1.19 | 1 |
| 1.20 | 5 |

## සිංහල - II පත්‍රය

2. (අ) (i) අධ්‍යාපනයට පදනම් වන ආගමික හා සදාචාරාත්මක අංශ සමගයි
(ii) පරතන්ත්‍ර අවස්ථා හා ස්වතන්ත්‍ර අවස්ථා
(iii) අනුන් අනුගමනය කිරීම
(iv) අත්දැකීම් මගින්, අනුකරණයෙන්
(v) පවුල, ආගමික ආයතන, පාසල **(ලකුණු 10යි)**

(ආ) පහත සඳහන් කරුණු කෙරෙහි මෙහි දී අවධානය යොමු විය යුතු ය.

- ★ ජනගහනයේ වර්ධනය නිසා ඔවුනගේ මූලික අවශ්‍යතා ද, සෞඛ්‍ය, ආරක්ෂාව ඇතුළු සේවාවන් ද සැපයීමට සිදු වේ.
- ★ ජීවන තත්ත්වය නැංවීමටත්, නිර්යාත භාණ්ඩ මිල විචල්‍යතාවන්ට මුහුණ දීමටත් නිෂ්පාදනය නැංවිය යුතුයි.
- ★ එහි දී අවධානය යොමු කළ යුත්තේ නව ශිල්ප ක්‍රම හා උපකරණ කෙරෙහි ය. ඊට අවශ්‍ය පුහුණු ශ්‍රමය සඳහා කාර්මික අධ්‍යාපනය නැංවිය යුතුයි.
- ★ කාර්මික අධ්‍යාපනයට යොදන මුදල් ප්‍රාග්ධන ආයෝජනයකි. එම ආයෝජනයෙන් නිෂ්පාදනය වැඩි වී, භාණ්ඩ සුලභ වී, මිල අඩු වී හිතකාමී පරිසරයක් ගොඩ නැගේ.

**(ලකුණු 15යි)**

- සාරාංශය එක් ඡේදයක් ලෙස දැක්විය යුතුය. ඡේදවලට බෙදා ඇත්නම් ලකුණු අඩු වේ.
- සාරාංශයේ වචන සංඛ්‍යාව 75 - 85 අතර විය යුතුය.

3. රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

- ★ රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය.
- ★ ඒ කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
- ★ කරුණුවල පැහැදිලි බව
- ★ නිවැරදි අක්ෂර වින්‍යාසය අනුගමනය කිරීම
- ★ ව්‍යාකරණ දෝෂ රහිත වීම
- ★ භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
- ★ සුදුසු ලෙස ඡේද වෙන් කිරීම
- ★ කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම
- ★ විවිධ භාෂාත්මක අංග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකිය)

  වචන සංඛ්‍යාව අඩුවීම හෝ වැඩිවීම හෝ ලකුණු අඩුවීමට හේතුවකි. **(ලකුණු 25යි)**

4. (අ) (i) ''දරුවන් හොඳින් පාඩම් කරති'' යි දෙමාපියෝ සිතති.
(ii) ඔවුහු ශ්‍රී ලංකාව නියෝජනය කරන ක්‍රීඩකයෝ වෙති.
(iii) ගුරුවරයකු වූ සිරිදාස මහතා දක්ෂ සංගීතඥයෙක් ද වෙයි.
(iv) අප විසින් සත්පුරුෂයෝ අගය කෙරෙති/කරනු ලබති/ලැබෙති/ලබත්/කරනු ලබන්නෝය
(v) විදේශීය තානාපතිවරුන් සම්මේලනයට පැමිණ නැත. **(ලකුණු 05යි)**

(ආ) (i) ගුරුවරුන් විසින් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ යහමඟ යැවෙති/යවනු ලබති/යවනු ලබත්/යවනු ලබන්නෝය.

(ii) විදුහල්පතිතුමා විසින් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කෙරවෙයි/කෙරවේ/කරවනු ලබයි/කරවනු ලැබෙයි/කරවනු ලබන්නේය.

(iii) ශ්‍රී ලාංකිකයන් විසින් ජයග්‍රාහී ක්‍රිකට් ක්‍රීඩකයෝ හරසරින් පිළිගැනුණු/පිළිගැනුණහ/පිළිගනු ලැබූහ/ලැබූ/ලැබුවෝය/පිළිගන්නා ලද්දෝය/ලදූ/ලදහ.

(iv) මහාචාර්ය සරච්චන්ද්‍රයන් විසින් හෙළ නාට්‍ය කලාව නව මඟකට යොමු කෙරිණි/කැරිණි/යොමු කරන ලදී/ලද්දේය/කරනු ලැබීය/ලැබුවේය.

(v) නිර්මාණකරුවා විසින් ජීවිත පරිඥානයෙන් ලබා ගත් අත්දැකීම් ඇසුරෙන් රසවත් නිර්මාණ ඉදිරිපත් කෙරේ/කෙරෙයි/කරනු ලබයි/ලැබෙයි/ලබන්නේය. **(ලකුණු 05යි)**

(ඉ) (i) දේශපාලනඥයෝ (ii) ලේඛිකාවක (iii) ඔවුහු
(iv) දෙනෙකු (v) කවුරුද **(ලකුණු 05යි)**

5. (අ) (i) සිත්තැවුල/චිත්ත පීඩාව/ චිත්ත සන්තාපය
(ii) පක්ෂපාතීව/එක් පැත්තකට බර වී
(iii) පිළිකුල් සහගත **(ලකුණු 03යි)**

(ආ) (i) ජාත්‍යන්ධ (ii) අධෝ ලිපිය (iii) සන්නාහය **(ලකුණු 03යි)**

(ඉ) (i) දාහය (ii) අනුස්මරණය (iii) සහජීවනය
(iv) අනුපම (v) ස්මරණ (vi) අනුල්ලංඝනීය **(ලකුණු 03යි)**

(ඊ) (i) මුව - මුඛය, මුවා, මෘගයා, කෙසෙල් මුව
(ii) පිය - පියා, ඇසිපිය, පාද, උපකාරක ක්‍රියාවක්, පියාපත්
(iii) පා - ප්‍රාසාදය, පාත්‍රය, පෙන්වා, ගෞරවාර්ථ පදයකි
(iv) දළ - ඇත්දළ, දන්ත ධාතුව, මහත්
(v) තෙර - ස්ථවිර, කෙළවර
(vi) කර - දැළි පිහිය, ක්‍රියා අර්ථය, අත, ඇත්හොඬ, ලුණු රසය, රශ්මිය **(ලකුණු 06යි)**

6. (i) (විභක්ති) සමාස/ (ආධාර) විභක්ති, මිශ්‍ර ක්‍රියා, නිපාත
(ii) (අතීත) කෘදන්ත, තද්ධිත/(අව්‍යය) සමාස, (සම්ප්‍රදාන) විභක්ති
(iii) උපසර්ග/තද්ධිත/කර්ම විභක්ති/අව්‍යය සමාස, තද්ධිත/(සම්ප්‍රදාන) විභක්ති, සන්ධි/අව්‍යය සමාස
(iv) (විභක්ති) සමාස, අවධි විභක්ති, (අතීත) කෘදන්ත
(v) සන්ධි, (සම්බන්ධ) විභක්ති, වර්තමාන කෘදන්ත **(ලකුණු 15යි)**

7. (අ) (i) ගලෙන් පට්ටයක් ගන්නවා වගේ
ඉදිකටු සිදුරකින් ඔටුවෙක් පන්නනවා වගේ
යතුරු කවුළුවෙන් ඇතෙක් අදිනවා වගේ
(ii) අඟේ ඉඳන් කන කනවා වගේ
එකපතේ කකා බොටුව කැපුවා වගේ
(iii) එපා වාහෙට හොඳි බෙදීම
පල නොකියා පලා බෙදීම
(iv) වඳින්න ගිය දේවාලේ ඉහේ කඩා වැටුණා වගේ
(v) කෑ මකුණාත් එකයි නො කෑ මකුණාත් එකයි
කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගෙයි
(vi) ලූලා නැති වළට කණයා පණ්ඩිතයා
ගස්නැති රටේ එරඬු ගහත් ගහකි **(ලකුණු 03යි)**

(ආ) දී ඇති රූඪී යොදා උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව යෙදූ වාක්‍ය නිර්මාණය කළ යුතුයි.
රූඪීවල අරුත්

(i) ප්‍රමාණය ඉක්මවීමෙන් දුර්විපාක ලැබීම
(ii) තම කාරිය කෙරුණාට පසු උපකාරය අමතක වීම
(iii) සුදුසු අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම/ නියම වැඩය නියම කාලයට කර ගැනීම
(iv) දුර්ලභ දෙයක් සෙවීම/ දුර්ලභ දෙයක් ලබා ගැනීමට උත්සාහ කිරීම
(v) අපකීර්තියට/ ලජ්ජාවට පත් වීම
(vi) නැති වූ දෙයෙහි අගය ඉහළින් සැලකීම **(ලකුණු 03යි)**

(ඉ) (i) සමානාර්ථවත් පද යෙදීම (ii) සමීපාර්ථවත් පද යෙදීම
(iii) විරුද්ධාර්ථ පද දෙකක් යෙදීම (iv) අර්ථවත් පදයක් සමඟ අර්ථ රහිත පදයක් යෙදීම
(v) සමීපාර්ථවත් පද දෙකක් යෙදීම (vi) අරුත් රහිත පද දෙකක් යෙදීම **(ලකුණු 03යි)**

(ඊ) (i) මාළු (ii) මැලවෙනවා (iii) වසම/කොට්ඨාසය
(iv) බීවා/පානය කළා (v) කුහුඹු විශේෂයකි (vi) හෙවනැල්ල **(ලකුණු 03යි)**

(උ) (i) සූදානම් කරනවා
(ii) දැල එලීම
(iii) යාඥා කරනවා
(iv) කණ්ඩායමේ නායකයා (වන්දනා නඩයක නායකයා)
(v) කමතේ දී ගොයම් කොළ මඩවන හරකුන් පසුපස යාම
(vi) පොළව යට පතල්වල තිරස් අතට විහිදෙන උමං මාර්ගය **(ලකුණු 03යි)**

8. (i) උගත් පුද්ගලයන් අතර සේවා වියුක්තියෙහි අඩුවීම දිරිමත් කරවනසුළු වර්ධනයකි. අ.පො.ස. (උසස් පෙළ) සහ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගල කාණ්ඩය තුල සේවා වියුක්තිය 2011 වසරේ පැවති සියයට 9 හි සිට 2012 වසරේ දී සියයට 7.5 දක්වා අඩු විය. කෙසේ වුව ද, ඉහලම සේවා වියුක්ති අනුපාතිකය වාර්තා කළ මෙම කාණ්ඩයට පසුව වැඩි ම සේවා වියුක්ති අනුපාතිකය වාර්ථා වී ඇත්තේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සුදුසුකම් සහිත පුද්ගල කාණ්ඩය අතර ය. මෙම කාණ්ඩයේ සේවා වියුක්තිය 2011 වසරේ දී පැවති සියයට 5.2 හි සිට 2012 වසරේ සියයට 6 ක් දක්වා ඉහල නැගිණි. 2012 වසරේ දී සමහර වයස් කාණ්ඩයන් සඳහා සේවා වියුක්තිය පහළ ගිය ද, තරුණ සේවා වියුක්තිය ඉහල අගයක පැවතිණි.

(ii) කරවන සුලු
ඉහළ
තුළ
වාර්තා

(iii) (අ) සේවා නියුක්තියෙහි
(ආ) අධෛර්යවත් කරන/ දිරිමත් නොකරන/ පසුබස්වන

(iv) කාණ්ඩය නැගිණි/ පැවතිණි
වර්ධනයකි/ වාර්තා වසරේ

(v) වියුක්තියෙහි සුදුසුකම්
දිරිමත් වියුක්තිය **(ලකුණු 15යි)**